
# වතුර මල

21

සිය අත්දැකීම් සහ අලුතෙන් දැන ගත් දෙය ස්වකීය සමූහයේ සෙසු සාමාජිකයන්ට කියා පෑමටත්, ඊළඟ පරම්පරාවට අත්දැකීම් උරුම කර දීමටත් මනුෂ්‍යයා කතාන්තර කීම අරඹන්නට ඇත. ඉන් පසුව ආගමික හා උපදේශාත්මක කතා කලාවක් බිහි විය. පසු කලෙක, රස ජනනය වන ආකාරයේ කතා කලාවක් ක්‍රමිකව වර්ධනය විය. කෙටිකතා කලාව ද එහි ප්‍රතිඵල වශයෙන් බිහි වූවකි. විවිධ මානව අත්දැකීම් පදනම් කර ගත් සාහිත්‍යාංගයක් ලෙස කෙටිකතාව වැදගත් වේ. එක් සුවිශේෂ සිදුවීමක් වටා ගොඩ නැගෙන ආඛ්‍යානයක් වන එහි, විවිධ මානුෂීය සංසිද්ධි සංගෘහීත වේ. කෙටිකතාවක් රස විඳීමට හෝ නිර්මාණය කිරීමට අත්දැකීම් ගැඹුරින් විමසා බැලිය යුතු වේ. කෙටිකතා රචනයට අවශ්‍ය පරිචය ලබා ගැනීමට සාර්ථක කෙටිකතා පරිශීලනය ද වැදගත් ය. මේ පාඩමට ඇතුළත් වන්නේ 1983 වසරේ හොඳ ම සිංහල කෙටිකතා සංග්‍රහය ලෙස සම්මානයට පාත්‍ර වූ සුදු කොඩි කෙටිකතා සංග්‍රහයෙන් උපුටා ගත් කතාවකි. එහි කතුවරයා වන ඇරැව්වල නන්දිමිත්‍ර ප්‍රකට නූතන ලේඛකයෙකි.



මානව සංහතියේ ආරම්භයේ සිට ම මිනිසා කතන්දර කීමේ හා ඇසීමේ කුතුහලයෙන් යුක්ත විය. ආරම්භයේ දී අත්දැකීම් හා අලුතින් දැන ගත් දෑ සිය සමූහයේ සෙසු සමාජිකයන්ට කියා පෑමටත් දෙවනුව ඊ ළඟ පරම්පරාවට අත්දැකීම් උරුම කර දීමටත් මනුෂ්‍යයා කථාන්තර කීම අරඹන්නට ඇත. ඊ ළඟ පියවර ආගමික/උපදේශාත්මක කතා කලාවකි. පසුව රස ජනනය අරමුණු කර ගත් කතා කලාව වර්ධනය වූ බව පෙනේ.

කෙටිකතාවක් රස විඳීමේ දී හෝ නිර්මාණය කිරීමේ දී මූලික කරුණු කීපයක් කෙරෙහි අවධානය යොමු කළ යුතු ය.

අපූර්වත්වයෙන් හා විශ්වසනීයත්වයෙන් යුක්ත නිර්මාණයක් බිහි කිරීමට සුදුසු අත්දැකීමක්, අනුභූතියක් හෝ සංසිද්ධියක් නිර්මාණකරුවා සතුව තිබීම වැදගත් ය. එය කෙටිකතාවේ තේමාව යි. එනම් කෘතියෙන් ප්‍රකාශ වන සමස්ත අර්ථය යි. අනෙකුත් කෙටිකතාංග සියල්ල තේමාව මත පදනම් වෙයි. තෝරා ගන්නා කතා ප්‍රවෘත්තිය ආරම්භයක්, විකාශයක්, අවසානයක් ඇති තර්කානුකූල හේතුඵල සම්බන්ධතාවක් සහිත සිද්ධි දාමයක විකාශයක් වෙයි. මෙය කථා වින්‍යාසය නමින් හැඳින්වෙයි. කෙටිකතා නිර්මාණයේ දී වඩාත් ප්‍රබලව අවධානය යොමු වන්නේ චරිත නිරූපණය කෙරෙහි ය. කෙටිකතාවක නිරූපණය විය යුත්තේ එක් ප්‍රබල චරිතයක් හෝ චරිතාංගයකි. මේවා සංකීර්ණ චරිත ය. බාහිරවත් ආධ්‍යාත්මිකව මෙන් ම මානසිකවත්, සමාජ ජීවිතයේ දීත් විවිධ ධර්මතාවලට මුහුණ දෙන චරිත විය යුතු ය. එකී චරිත කතුවරයා ම මැදිහත් වීමෙන් හෝ අනෙකුත් චරිත හා ගැටීමට සැලැස්වීමෙන් හෝ ජීවන ගැටලුවලට මුහුණ දීමට සැලැස්වීමෙන් හෝ නිරූපණය කරයි. "කෙටිකතාවක් යනු ජීවිතයෙන් පෙත්තක් විවරණය කිරීමක්" යනුවෙන් ඇන්ටන් චෙකොෆ් දැක්වූයේ මේ අදහස ය.

පුද්ගල අත්දැකීම් හා බැඳුණු පරිසරය හෝ මානසික ස්වභාවය දැක්වීමට උපක්‍රමයක් ලෙස පසුබිම් වර්ණනා යොදා ගැනීමට නිර්මාණකරුවා යොමු විය හැකි ය. කෙටිකතාකරුවා ඒ මගින් තම දෘෂ්ටිය කලාත්මකව ඉදිරිපත් කරයි. චරිත ගැන ඍජුව විවරණය කළ නො හැකි දේවල් සංකේතවත් කළ හැකි ය. එසේ ම ලේඛකයා තම නිර්මාණය යථාර්ථවාදීව හා තාත්විකව ඉදිරිපත් කළ යුතු ය. එය යථාර්ථ නිරූපණය ලෙස හැඳින්වෙයි. මධ්‍යස්ථ කලාත්මක දෘෂ්ටියකින්, සමාජ පන්ති භේදය තුළින්, සමාජ විෂමතා ආශ්‍රයෙන් උපහාසය හෝ විවේචනය මගින් මෙකී යථාර්ථ නිරූපණය කළ හැකි ය. මීට අමතරව සියුම් පුද්ගල මනෝභාවයන්, මානසික ගැටුම් සමාජමය ගති ස්වභාවයන්, කාලය ආදි අවස්ථා ප්‍රබල ලෙස නිරූපණය කිරීමට අවශ්‍ය අවස්ථාවක සංකේත භාවිතයට නිර්මාණකරුවා පසුබට නො වේ. විටෙක ලේඛකයා ම ඉදිරිපත් වී චරිත නිරූපණය කරන අතර විටෙක කතුවරයා පසෙකට වී වෙනත් අයකු ලවා කතාව කීමට සලස්වයි. පාඨකයා වෙත කතාවක් ඉදිරිපත් කිරීමේ දී ලේඛකයා රැඳී සිටින ස්ථානය දෘෂ්ටි කෝණය යනුවෙන් හැඳින්වෙයි. කෙටිකතා තේමාවට අනුව ප්‍රථම පුරුෂ, උත්තම පුරුෂ ආදි දෘෂ්ටි කෝණ භාවිතයට ගැනේ.

සමස්ත නිර්මාණය ඇගයුමට ලක් කෙරෙන විට සමාජය, ජීවිතය, මනුෂ්‍යත්වය, මිනිස් ක්‍රියාකාරකම් කෙරෙහි ලේඛකයාගේ අවධානය යොමු වෙයි. ඒ කෙටිකතාවක ජීවන දෘෂ්ටියයි.

සාහිත්‍ය කෘතියක් යනු භාෂාව භාවිතයට ගනිමින් කෙරෙන අපූරු සිත්තමකි. භාෂාත්මක හරඹයකි. එබැවින් කෙටිකතා කරණයේ දී නිර්මාණාත්මක භාෂාවක් යොදා ගැනීම ඉතා

වැදගත් ය. ගැටලු, චරිත, සමාජ පසුබිම්, අවස්ථා, සිද්ධි වඩාත් අපූර්වත්වයෙන් ඉදිරිපත් කිරීමට භාෂාවේ නිර්මාණාත්මක බව අත්‍යවශ්‍ය ය. තේමාවට ගැළපෙන ආකාරයෙන් විවිධ භාෂා විලාස හා රචනා රීති යොදා ගත හැකි ය. ලේඛන රීතිය හෝ භාෂණ රීතිය අනුගමනය මෙයින් එක් මාර්ගයකි. ප්‍රාදේශික ව්‍යවහාර, පැරණි සාහිත්‍යගත ව්‍යවහාර ආදිය යොදමින් රචකයාට සිය වාග් විලාසය සකස් කර ගත හැකි ය. එලෙස යොදන සෑම වචනයක ම අර්ථය මෙන් ම ධ්වනිය ද විශේෂත්වයක් ගනී.

කෙටිකතාවක් තුළ පවතින සිද්ධි, අවස්ථා, චරිත, අනුචරිත, පසුබිම් වර්ණනා, සංකේත භාවිතය ආදි මේ සියල්ලෙහි ඒකාබද්ධතාවක් පැවතීම නිර්මාණ රස වින්දනයට මෙන් ම නිර්මාණකරණයට එක සේ වැදගත් වෙයි. එය කලාත්මක ඒකාබද්ධතාව යනුවෙන් හඳුන්වමු.

ජෝසෆ් බර්ග් එසන්වීන් කෙටිකතාව පිළිබඳව දක්වා ඇති නිර්වචනයෙහි මෙකී කෙටිකතා ලක්ෂණ බෙහොමයක් ගැබ්ව ඇත.

> “කෙටිකතාව වනාහි අනෙක් සිද්ධි අබිබවා සිටින එක් ප්‍රබල සිද්ධියක් හා එක් ප්‍රබල චරිතයක් අනාවරණය කරන්නා වූ ද, එකට කැටිව තිබෙන කථා වින්‍යාසයක් සහිත වූ ද, ඒකත්වයෙන් යුක්ත ධාරණාවක් ඇත්තා වූ ද අඩු දිග ප්‍රමාණයකින් යුක්ත වූ ද පරිකල්පනාත්මක ආඛ්‍යානයකි.”

## වතුර මල

සිරිමාන්න මහත්තයාත් අබිලින් උන්නැහේත් කලක සිට හිත මිතුරෝ ය. එසේ ම ඔවුහු දෙදෙනා ඉද්දමල්දෙණිය පූර්වාරාම විහාරස්ථානයේ උද්‍යෝගිමත් දායකයෝ ය. දායක සභාවේ සභාපති වූයේ ද සිරිමාන්න මහත්තයා ය.

පාසල් ගුරුවරයෙකු වශයෙන් සේවය කරමින් සිටි සිරිමාන්න මහත්තයා සේවයෙන් විශ්‍රාම ගියේ මීට දෙ වසරකට පමණ පෙර ය. ඔහු පාටින් කළු ය. උසින් තරමක් අඩු ය. සිරුර මහත ය. හිස ඉදිරිපස තට්ටය පෑදී තිබූ අතර එම තට්ටය වැසීම සඳහා හිස පසු දෙස කෙස් දිගට වවා ඉතා අමාරුවෙන් හිස ඉදිරි පසට ගෙනැවිත් තබා තිබුණේ ය.

සිරිමාන්න මහත්තයාට කිසි ම පවුල් බරක් නො වී ය. ඔහුට දියණියන් දෙදෙනෙකු සිටි අතර ඔවුහු දෙදෙන ගුරුවරියන් වශයෙන් සේවය කළහ. සිරිමාන්න මහත්තයා තමා පිනට ඉතා කැමති බව නිතර කාටත් ඇඟවී ය. එසේ ම ඔහුගෙන් ගමට සිදු වූ සේවාව ගැන නිතර සඳහන් කළේ ය. “මේ ගමේ මිනිස්සුන්ට අගයක් නැතුවට මම තරම් මේ ගමට කිසි ම මිනිහෙක් සේවය කරල නැහැ.” ඔහුගේ මුවින් නිතර ම පාහේ මෙ වැනි වචන පිට වෙයි. කවර අයුරින් කතා කළත් ඔහු මුදල් වියදම් කිරීමට අකැමැති ය. ඉගැන්වීමට යන කාලයේ දී රෝස් පාන් ගෙඩියක් තේ කහට කෝප්පයක පොඟවා ගෙන කා උදේ පාසලට යන ඔහු ආපසු දවල් දෙකට පමණ ගෙදර පැමිණ දිවා ආහාරය ගන්නා තුරු තේ කෝප්පයක් තරම වත් නො බොයි. දැනට වුව ද එහි කිසි ම වෙනසක් නැත. කවර වැඩක් කිරීම සම්බන්ධයෙන් යෝජනාවක් ඉදිරිපත් වුවත් මොහොතක් දෙනෙත් පියා ගෙන ඉන්නා ඔහු සුරතින් මුහුණ පිස දමමින් මෙසේ කියයි.

"මොනව කළත් නිකන් අපරාදෙ මුදල් නාස්ති කරන්න නරක යි."

අබිලින් උන්නැහේ තමන් සතු ඉඩකඩම්වල ගොවිතැන් බත් කරගෙන කරදරයක් නොමැතිව ජීවත් වූ තැනැත්තෙකි. ඔහු පැහැයෙන් තල එළලු ය. තරම් මහත නැත. උසින් අඩි පහමාරක් හයක් පමණ ඇත. උඩු රැවුළ වවලා ය. කොණ්ඩය පස්සට පීරා දොඹ ගෙඩියක් තරම් වූ කොණ්ඩයක් බැඳ සිටියේ ය. මහලු බව හොරෙන් හොරෙන් පැමිණ මහත් වූ ආදරයකින් මෙන් ඔහු වැලඳ ගැනීමට වැර දරයි.

අබිලින් උන්නැහේට සිටියේ එක ම පුතෙකු පමණි. ඔහු ද විවාහයක් කර ගෙන ගෙදර ම පදිංචි වී සිටියි. අබිලින් උන්නැහේ පිනට ඉතා කැමැති ය. විශාල ධනවතෙකු නො වූවත් අවශ්‍ය දේට වියදම් කිරීමට නිර්ලෝභී ය. හොඳට හීල් බත් පිඟානක් කා දවසේ වැඩ ආරම්භ කරන ඔහු දවල් දොළහ පමණ වන තුරු එක දිගට වැඩ කරයි. ඉන්පසු ගෙදර පැමිණ දිවා ආහාරය ගෙන දවල් දෙක හමාර තුන පමණ වන තුරු විවේකීව ගෙදර සිටියි. නැවත ඕවිටක හෝ කුඹුරක හෝ වැඩට යයි. දවසේ වැඩ අවසන් කර වත්ත පහළ ළිඳෙන් දිය නාගෙන ආපසු ගෙදර එන්නේ සැඳෑ අඳුර ගලා හැලෙන විට ය.

අබිලින් උන්නැහේ සැඳෑ අඳුර අතරින් ගෙදර පැමිණි විට ඔහුගේ බිරිඳ ඔහු ළඟට එන්නේ දුම් දමන කෝපි කෝප්පයක් හා කිතුල් හකුරු කෑල්ලක් ද රැගෙන ය. අබිලින් උන්නැහේ කුස්සිය පැත්තේ කෙටි ඉස්තෝප්පු කෑල්ලේ තිබෙන පරණ පුටුවක වාඩි වී කෝපි කෝප්පයෙන් උගුර උගුර පානය කරන්නේ මුළු සිරුර ම අපූරු උණුසුම් සුවයකින් ප්‍රබෝධයට පත් කරමිනි.

විශ්‍රාම යාමෙන් පසු ගෙදර දොරේ තිබෙන සුළු සුළු වැඩපළ කිරීමෙන් හා පොතක් පතක් කියවීමාදියෙන් කාලය ගෙවා ගන්නා සිරිමාන්න මහත්තයා විශේෂ වැඩක් නොමැති හැම දිනක ම පාහේ ඇඳිරි වැටුණ පසු විදුලි පන්දම ද ගෙන අබිලින් උන්නැහේගේ ගෙදරට යයි. දවසේ වැඩ අවසන් කරන අබිලින් උන්නැහේ ගෙදර පැමිණ කෝපි කෝප්පය බොමින් සිටින්නේ මේ වේලාවට ය. සිරිමාන්න මහත්තයා එනු දුටු විට අබිලින් උන්නැහේගේ හිත තුළ නිරායාසයෙන් සතුටක් ඇති වෙයි.

"ආ... එන්න... එන්න සිරිමාන්න මහත්තය, වාඩි වෙන්න." මෙලෙස පැවසීමෙන් පමණක් නිහඬ නො වන අබිලින් උන්නැහේ කුස්සිය දෙසට හිස හරවා තරමක් හඬ නඟා සිය බිරිඳට මෙසේ කියයි.

"මේ ඇහුණ ද? සිරිමාන්න මහත්තය ඇවිල්ල. කෝපි කෝප්පයක් හදා ගෙන වරෙල්ලා."

"මම දැන් තේ එකක් බීපු ගමන් ආවෙ. මට නම් දැන් කෝපි හදන්න එපා."

සිරිමාන්න මහත්තයා පුරුද්දට වගේ මෙ ලෙස පවසන නමුදු නො පමාව දුන් දමන කෝපි කෝප්පයක් හා කිතුල් හකුරු කෑල්ලක් ඔහු අතට ගෙනැවිත් දීමට අබිලින් උන්නැහේගේ බිරිඳ පමා නො වෙයි. කෝපිවලින් සප්පායම් වීමෙන් පසු සිරිමාන්න මහත්තයාත්, අබිලින් උන්නැහේත් පැයක පමණ වේලාවක් කතාබහ කරමින් කාලය ගත කරන්නේ ඉතා සතුටිනි. මෙම කතා බහට ඔවුන්ගේ දරුවන් පිළිබඳ විස්තර, රටේ තොටේ ආරංචි, අබිලින් උන්නැහේගේ ගොවිතැන් වැඩ, සිරිමාන්න මහත්තයාගේ කීර්ති රාවය, ඊළඟ පෝයට සිල් සමාදන් වීම ආදි මෙකී නො කී නොයෙකුත් කාරණා විෂය වෙයි. මෙසේ කතා කරමින් සිටින අතර දිනක් අබිලින් උන්නැහේ තම බලාපොරොත්තුවක් සම්බන්ධයෙන් සිරිමාන්න මහත්තයා සමග කතා කළේ ය.

"දැන් ටික දවසක ඉඳල මට පොඩි වැඩක් කරන්න කියල හිතිල තියෙනව සිරිමාන්න මහත්තය. මම මේ ගැන සිරිමාන්න මහත්තය එක්කල කතා කරන්න කියලමයි හිතා ගෙන හිටියෙ."

"ඒ මොකක් ද අබිලින් උන්නැහෙ?"

"දැන් බලන්න අපි පන්සලට මල් ටිකක් පූජා කරන්න ගියාම මල් ටික දොහොන කරන්නයි, අත් දොහොන කර ගන්නයි තියෙන කරදරේ. පැන් ටික ගේන්න තියෙන්නෙ පරණ මැටි කොතල කබලක්. මල් පූජා කරන්න එන මනුස්සයො ඔය මැටි කොතල කබල අරගෙන කී සැරයක් නම් ළිඳ ළඟට යනව ද පැන් ටික ගේන්න."
"අබිලින් උන්නැහෙගෙ ඒ කතාව නම් ඇත්ත තමයි."

"ඔන්න ඔය හින්ද ම මම කල්පනා කළා විහාරෙ ළඟින් වතුර මලක් හදන්න. දැනටමත් පන්සලට නම් පයිප්ප හයි කරල තියෙන හින්ද ඔය වැඩේ කරන්න ඒ තරම් අමාරු වෙන එකක් නැහැ."

"ඒ වුණාට අබිලින් උන්නැහෙ, අද කාලෙ හැටියට ඔය වැඩේ කරන්න සැහෙන වියදමක් යනව. අපේ ගමේ මිනිස්සුන්ගෙන් එකපාරට ම ඔය වැඩේට සැහෙන තරම් මුදලක් එකතු කරන්න ලේසි නැහැ."
"මම මේ වැඩේට සතයක් වත් සම්මාදන් කරන්න බලාපොරොත්තු වෙනේනේ නැහැ. කොහොම හරි මම මේ වැඩේ මගෙ තනි වියදමින් කරනව. සිරිමාන්න මහත්තය මට කියන්න මේ වැඩේ හොඳ ද කියන එක විතරක්."

"ඔව් ඉතින්, ඔය වැඩේ නම් නරකයි කියන්න බැහැ."
සිරිමාන්න මහත්තයා එදා ආපසු ගෙදර ගියේ වෙන දා නොමැති විස්මයකිනි. 'යකෝ මේ මනුස්සය එක පාරට ම කරන්න කල්පනා කරල තියෙන්නෙ අමුතු ම තාලේ වැඩක් නෙ! එච්චර විතරක් නො වෙයි. ඒ වැඩේට තනියම වියදම් කරන්නයි බලාපොරොත්තුව.' පූර්වාරාම විහාරස්ථානයේ තමාගේ වියදමින් ද එබඳු දෙයක් කරන්නට ඇත්නම් හොඳ යයි ඔහුට මොහොතකට සිතුණි. එහෙත් එබඳු දෙයක් කිරීම සඳහා කොපමණ විශාල මුදලක් වැය වේ ද යන ප්‍රශ්නය ඒ සමග ම ඔහු ඉදිරියේ හොල්මන් කරන්නට විය.

ඉද්දමල්දෙණියේ සිටින දක්ෂ ම මේසන් බාස් කෙනෙකුගේ සහාය ලබා ගත් අබිලින් උන්නැහේ වතුර මල තැනීමේ වැඩ ආරම්භ කෙරෙව්වේ ය. ඔහු ඒ සඳහා කිසි ම අඩිමඩි කිරීමකින් තොරව වියදම් කළේ ය. වැඩ අවසන් වූ විට වතුර මල මුළු විහාර භූමිය ම අලංකාරයට පත් කෙරෙන නවාංගයක් විය.

වතුර මල බෙහෙවින් පියකරු ය. වටේට කවාකාර බැම්මක් බැඳ පොකුණක් තනා තිබේ. එහි නිලට නිලේ ජලය පිරිලා ය. ඒ මැද තනන ලද නටුව මත පිපී ගිය විශාල ප්‍රමාණයේ නෙලුම් මලකි. නටුවෙහි දෙපසට නෙලුම් කොළ දෙකක් ද වෙයි. නෙලුම් මල මුදුනින් සතර අතට විහිද යන සිහින් ජල රේඛාවෝ ය. නෙලුම් මලේ පෙතිවල ළා රත් පැහැති තීන්තත්, නටුවෙහි හා නෙලුම් කොළවල කොළ පාට තීන්තත් ආලේප කර තිබේ. කවාකාර පොකුණ වටා යකඩවලින් ලස්සන ගරාදි වැටක් ගසා එහි රිදී පාට තීන්ත ආලේප කර ඇත. වතුර මලට ආලෝකය වැටීම සඳහා පසෙකින් විශේෂ විදුලි බුබුළක් සවි කර තිබේ. පන්සලට පැමිණෙන කවුරුත් පාහේ වතුර මල දෙස ටික වේලාවක් ආසාවෙන් බලා ගෙන සිටිති.

වතුර මල තැනීම නිසා විහාරස්ථාන භූමියේ ඇති වූ අපූරු කලඑළිය වඩාත් ජීවමානාකාරයෙන් ප්‍රභාවත් වූයේ පෝයදාට ය. විශේෂයෙන් සවි කර තිබෙන විදුලි බුබුළේ ආලෝකයෙන් වතුර මල ඇති පෙදෙස ආලෝකවත්ව ඇත. සිල් සමාදන් වී සිටින උපාසක උපාසිකාවෝත්, මල් පහන් පූජා කිරීම සඳහා විහාරස්ථානයට පැමිණෙන ලොකු කුඩා සියලු දෙනාත් වරින් වර වතුර මල ළඟට ගොස් රිදී පාට ගරාදි වැටට හේත්තු වී වතුර මලෙන් සතර අතට විහිද යන සිහින් ජල රේඛාවන් දෙසට දෑත් දිගු කර අත් ධෝවනය කරති. මල් ධෝවනය කරති. ඔවුන්ගේ මුහුණු ප්‍රීතියෙන් ආලෝකවත්ව ඇත. වතුර මලේ සිසිල් ජලයෙන් අත් ධෝවනය කර ගන්නා ළමයි සිනාවෙන් මුව සරසා ගෙන විහාර මළුව දෙසට දිව යති. තවත් මොහොතක සීතල වතුර ටිකක් අතට ගන්නා ළමයෙක් ඉන් බින්දු කිහිපයක් තම යහළු ළමයෙකුගේ මුහුණට ඉසියි. ඔවුහු දෙදෙනා හඬ නඟා සිනාසෙති. සිල් සමාදන් වී විහාර මළුවේ සිටින අබිලින් උන්නැහේ, වතුර මලෙන් ප්‍රයෝජන ගන්නා සැදැහැවතුන් දෙස ටික වේලාවක් බලා ගෙන සිටින්නේ හද තුළ උතුරා යන සතුටකිනි. සිල් සමාදන් වූ සිරිමාන්න මහත්තයා ද ඔහු අසල සිටියි.

''බලන්නකො සිරිමාන්න මහත්තයා, මනුස්සයො වතුර මලෙන් ප්‍රයෝජන ගන්න අගේ.''

සිරිමාන්න මහත්තයා ද ටික වේලාවක් වතුර මල දෙස බලාගෙන සිටියි. එහෙත් වැඩිපුර කිසිවක් නො පවසන ඔහු නිහඬ වෙයි.

''අබිලින් උන්නැහෙ වතුර මල හදල කරපු වැඩේ වටිනකම නම් කියල නිම කරන්න බැරි තරම්.'' මල් ටිකක් දොහොන කර ගෙන පූජා කිරීම සඳහා විහාරයට යන ගමන් අයෙක් අබිලින් උන්නැහේ අසලට පැමිණ පවසති.

''වතුර මල නම් හරි ලස්සන යි, අබිලින් ආතෙ.'' ළමයෙක් අබිලින් උන්නැහේ ළඟට පැමිණ පවසා යළි වතුර මල දෙසට දිව යයි.

තමා විසින් කරවන ලද වතුර මල ගැන ගම්වාසීන් තුළ මේ තරම් ප්‍රසාදයක් ඇති වේ යයි අබිලින් උන්නැහේ කලින් සිතා ගෙන නො සිටියේ ය. ඔහු සිනාවකින් මුව සරසාගෙන බලා සිටින්නේ මේ වගේ වැඩ තවත් කරන්නට ඇත්නම් කොච්චර හොඳ ද යන අදහස හද රුවා ගෙන ය. අබිලින් උන්නැහේ අසල සිටින සිරිමාන්න මහත්තයා එතනින් ඉවත් වී හෙමින් හෙමින් ධර්ම ශාලාව දෙසට යයි.
'පන්සලේ වතුර මල ඊයේ රෑ කවුද කඩා දාලා.'

මෙම ආරංචිය දිනක් උදෑසන ඉද්දමල්දෙණිය ගම පුරා අත් තටු ගසමින් ඉගිළී ගියේ ය. හැම දෙනාගේ ම හිත තුළ ඇති වූයේ කෝපයකි. අබිලින් උන්නැහේ කෝපයෙන් වියරු වැටී ගියාක් මෙන් විය. ඔහු පන්සල් වත්තට දිව ගියේ ය.
වතුර මලට ජලය සැපයෙන නළය සම්පූර්ණයෙන් ම තලා දමා තිබුණි. තනා තිබූ නෙලුම් මලේ පෙති මිටියක් වැනි දෙයකින් ගසා කඩා දමා තිබේ. වතුර මලට එළිය වැටීම සඳහා විශේෂයෙන් සවි කර තිබූ විදුලි බුබුළ පොඩි කරලා ය. වටේට කවාකාරව තනා තිබූ බැම්ම එක් තැනකින් කඩා දැමීම නිසා එහි වතුර නො රැඳී පිටට ගලා ගෙන යයි.

අබිලින් උන්නැහේගේ මුවින් පිට වීමට ආවේ අමු තිත්ත කුණුහරුප වැලකි. එහෙත් එම වචන මුවින් පිට නො කර ඔහු ඉතා අමාරුවෙන් මැඬ පවත්වා ගත්තේ තමා ඒ මොහොතේ සිටියේ විහාරස්ථානය අසල නිසා ය. ඔහු පන්සල් වත්තෙන් පිට වී කෙළින් ම ගියේ සිරිමාන්න මහත්තයාගේ නිවසට ය.

“බලන්න සිරිමාන්න මහත්තය, කවුද පාහරයෙක් කරල තියෙන අපරාධයක මහත!”

“මටත් ඕක ආරංචි වුණා. මමත් මේ පන්සල පැත්තට යන්න කියල හැදුවේ.”

“ඒක බලල වැඩක් නැහැ සිරිමාන්න මහත්තය. ලස්සනට තිබුණ වතුර මල විනාශ කරල ඉවරයි. මම එකක් කියන්නම් සිරිමාන්න මහත්තය. මම මීට පස්සේ හොඳ වැඩ කරන මිනිහෙක් නො වෙයි. කොටින් ම මම මීට පස්සේ ඔය පන්සලට වත් යන්නෙ නැහැ.”

“කෙරිල තියෙන්නෙ නම් බොහොම නරක වැඩක් තමයි. ඒ වුණත් කලබල නොවී ටිකක් අපි ඔය ගැන හොයල බලමු.”

“ඒ හොයල බැලිල්ලෙන් මට ඇති වැඩක් නැහැ. මම වචනයක් කිව්වොත් කිව්වමයි.”

අබිලින් උන්නැහේ සිරිමාන්න මහත්තයාගේ ගෙදරින් පිට වී ගියේ ද අඩු වූ කෝපයකින් නො වේ. සිරිමාන්න මහත්තයා අබිලින් උන්නැහේ ඈත නො පෙනී යන තුරු බලා ගෙන සිටියේ ය. ‘මිනිහ තරහෙන් පිස්සු වැටිල වගෙයි.’

පසු දින සවස දායක සභාව රැස් කරවූ සිරිමාන්න මහත්තයා කවුදෝ විසින් වතුර මල කඩා දැමීමෙන් කර තිබෙන පහත් ක්‍රියාව හෙළා දැක එය යළි ප්‍රතිසංස්කරණය කිරීමේ අවශ්‍යතාව පැහැදිලි කර දුන්නේ ය. හැම දෙනා ම ඒ අදහස අනුමත කළෙන් වතුර මල යළි ප්‍රතිසංස්කරණය කරවන ලදි. ඒ සඳහා වැඩි වශයෙන් ම වියදම් කළේ සිරිමාන්න මහත්තයා ය. එහෙත් ප්‍රතිසංස්කරණයෙන් පසු වතුර මලේ පෙර තිබූ ශෝභාව නම් යළි එලෙස ම දක්නට නො වී ය. එමෙන් ම අබිලින් උන්නැහේගේ වචනයෙහි ද කිසිම වෙනසක් නො වී ය. පන්සලේ දායකයකු වශයෙන් ඔහු තුළ තිබූ උනන්දුව සම්පූර්ණයෙන් ම දිය වී ගියේ ය. සිරිමාන්න මහත්තයා ද අබිලින් උන්නැහේගේ සිත සැනසීමට කීපවරක් ම උත්සාහ කරන ලද නමුදු එහි කිසි ම පලක් නො වී ය. වතුර මල කඩා දමන ලද්දේ කවරෙකු විසින් ද යන්න මෙතෙක් කිසිවෙකුට දැන ගැනීමට නො හැකි වූ අතර අබිලින් උන්නැහේට හැර අන් හැම දෙනාට ම පාහේ ක්‍රමයෙන් එම සිද්ධිය අමතක වී ගියේ ය.

වසරකට පමණ පසු සිරිමාන්න මහත්තයා නාන ළිඳ ළඟ වැටී අංශභාග රෝගය වැලඳී ඔත්පළ විය. ඒ සඳහා ඔහුට ප්‍රතිකාර කරන ලදි. අබිලින් උන්නැහේ ද නිතර යමින් එමින් තම හිතවතාගේ දුක සැප ගැන සොයා බැලී ය. බෙත් හේත් ආදිය සොයා දුන්නේ ය. එහෙත් ඒ කිසිම දේකින් පලක් නො වූ අතර මාස හතරක පමණ කාලයක් ඔත්පළව සිටි සිරිමාන්න මහත්තයා මිය ගියේ ය. අබිලින් උන්නැහේගේ සිත තුළ ඇති වූයේ විශාල කනගාටුවකි. සිරිමාන්න මහත්තයාගේ ආදාහන කටයුතු සඳහා ඔහු හැකි තරම් වෙහෙස මහන්සි වී වැඩ කළේ ය.

සිරිමාන්න මහත්තයාගේ හත් දවසේ දානය දුන් දිනට පසු දින සවස අබිලින් උන්නැහේ පූර්වාරාම විහාරස්ථානය අසලින් වැටී ඇති පාර ඔස්සේ ඉද්දමල්දෙණිය කඩමණ්ඩියට යමින් සිටියේ ය. පන්සලේ මිදුලේ සිටි ලොකු හාමුදුරුවෝ අබිලින් උන්නැහේ පාරේ යනවා දුටු සැණෙන් පාර අයිනට පැමිණ අබිලින් උන්නැහේට කතා කළහ.

“අබිලින් උන්නැහෙ, ටිකකට මෙහාට ඇවිදිල්ල යමුකො.”

වතුර මල කඩා දැමීමේ සිද්ධියෙන් පසු අබිලින් උන්නැහේ නිකමට වත් පන්සලට යාම් ඊමක් නො කරයි. ලොකු හාමුදුරුවන් පාර අයිනට ම පැමිණ කතා කළ නිසා ඔහුට මේ මොහොතේ මග හැර යාමට ද නො හැකි ය. ඔහු පන්සල් වත්ත පැත්තට හැරුණේ ය.

හාමුදුරුවෝ හෙමින් ඉදිරියට ගමන් කරති. උන් වහන්සේ යන්නේ පන්සල දෙසට නො ව බෝ මළුව දෙසට ය. අබිලින් උන්නැහේ ද නිසංසලව හාමුදුරුවන් පසු පස ගියේ ය. බෝ මළුවේ බැම්ම උඩින් වාඩි වූ ලොකු හාමුදුරුවෝ තමාත් අබිලින් උන්නැහේත් හැර වෙන කවුරු වත් අසලක සිටින්නේ දැයි දැන ගැනීමට මෙන් හොඳට වට පිට බැලූහ. වෙන කිසිවෙක් පෙනෙන්ට නො සිටියහ. ලොකු හාමුදුරුවෝ ඉතා කාරුණිකව අබිලින් උන්නැහේ දෙස බලා ඔහුට ද බෝ මළුවේ බැම්ම උඩින් වාඩිවෙන ලෙස පැවසූහ. ඒ අනුව අබිලින් උන්නැහේ ද වාඩි විය. තමා නැවතත් පන්සලේ වැඩට සම්බන්ධ කර ගැනීම සඳහා හාමුදුරුවන් විසින් අනුශාසනාවක් කිරීමට සූදානම් වන්නේ යයි ඔහුට සිතුණි. හාමුදුරුවෝ ඉතා සන්සුන් ලෙස වචන පිට කරන්නට පටන් ගත්හ.

"මම අබිලින් උන්නැහේට කතා කළේ බොහොම වැදගත් කාරණයක් ගැන කියන්න. මේ කතාව මම කිසිම දාක කාට වත් නො කියන්නයි මුලින් හිතාගෙන හිටියෙ. දැන් ඉතින් මේ කතාව අබිලින් උන්නැහේට විතරක් කියන්න ඕන කියල මම කල්පනා කළා. ඒත් අබිලින් උන්නැහේ මට පළමුවෙන් ම පොරොන්දු වෙන්න ඕනැ මේ කතාව කිසිම කෙනෙකුට නොකිය රහසක් වශයෙන් තියා ගන්න බවට."

"හොඳමයි, තමුන්නාන්සේ කියනව නම් මම පොරොන්දු වෙන්නම්."

"මම මේ කියන කතාව සමහර විට අබිලින් උන්නැහේ විශ්වාස කරන එකකුත් නැහැ. ඒත් මේක සම්පූර්ණ ඇත්ත. අබිලින් උන්නැහේ බොහොම අලංකාරව හැදෙව්ව වතුර මල කඩල දැම්මෙ සිරිමාන්න මහත්තයා."

එකවර ම තම ළමැද හරහා වේගයෙන් පහරක් වැදුණාක් මෙන් අබිලින් උන්නැහේට දැනුණි. ඔහුට ඔහුගේ සවන් අදහා ගත නො හැකි විය. තමා මේ දවල් හීනයක් දකින්නේ දැයි දැන ගැනීමට සේ ඔහු සුරතින් මුහුණ පිස දමා හොඳින් වට පිට බැලුවේ ය. ලොකු හාමුදුරුවෝ අල්පමාත්‍ර වූ හෝ කම්පනයකින් තොරව ඉතා සන්සුන් ලෙස කතා කර ගෙන යති.

"මමත් මේ කාරණය මගේ ම ඇස් දෙකෙන් දැක්කෙ නැත්නම් කවදා වත් විශ්වාස කරන්නේ නැහැ. එදා රෑ මම නිදාගන ඉන්න කොට විහාරෙ පැත්තෙන් මොකක් දෝ යාන්තමට සද්දයක් ඇහිල මට ඇහැරුණා. මම ඇඳේ දිගා වෙලා ඉඳගෙන ම ඒ පැත්තට කන් දුන්න. ආයිත් සැරයක් මට මොකක් ද තට්ටු කරනව වගේ සද්දයක් ඇහුණා. මම ඇඳ ළඟ තිබුණ ටෝච් එකත් අරගෙන හෙමින් හෙමින් විහාරෙ පැත්තට ගිහිල්ල සද්දෙ ඇහුණ දිහාවට ටෝච් එක අල්ලලා එළිය කළා. ටෝච් එළිය වැටුණේ හරියට ම හිටිය තැනැත්ත ගේ මුහුණට. බැලින්නම් සිරිමාන්න මහත්තය වතුර මල ළඟ. එයාට එක පාරට ම දුවගන්නට වත් ලැබුණේ නැහැ. මට මගේ ඇස් අදහා ගන්න බැරිව ගියා. සිරිමාන්න මහත්තයා සරම කැහැපොට ගන්න ගෙන, යකඩ උලක් අතින් අරගෙන හරියට ගෙවල් බිඳින්න යන හොරෙක් වගේ. මම කිට්ටු කරල ඇහුව මොකක් ද සිරිමාන්න මහත්තය මේකෙ තේරුම කියල. මිනිහට වචනයක් වත් කතා කර ගන්න බැරුව වෙවුලන්න පටන් ගත්ත. මං ඉදිරියෙ වැඳ වැටිල මේක කාටවත් කියන්න එපා කියලා ඉල්ලා හිටියා. එයාගේ වියදමෙන් වතුර මල හදන බවත් කිව්ව. මම කිව්ව ඒව පස්සෙ කර ගන්න පුළුවන්. මම මේ බව කාටවත් කියන්නේ නැහැ. මහත්තය දැන් ගෙදර යන්න කියල."

ඔන්න ඔය විදිහටයි අබිලින් උන්නැහේ වතුර මලට හානි සිද්ධ වුණේ. අද වන තුරා මම මේ ගැන කාට වත් හුස්මක් වත් හෙළුවෙ නැහැ. මම සිරිමාන්න මහත්තයා මළාට පස්සේ වත් මේ ගැන නොකියන්න යි හිතාගෙන හිටියෙ. සිරිමාන්න මහත්තය මළාට පස්සේ මම මේ කාරණය ගැන අබිලින් උන්නැහේට කියන්න තීරණය කළේ වතුර මල කැඩුව දා ඉඳලා පන්සල පැත්තට වත් නැවිත් කිසි ම පිනක් දහමක් නො කර ඉන්න හින්ද යි. දැන් ඉතින් ඔය විකාර අදහස් අතහැරල පිනක් දහමක් කර ගන්න බලන්න. අබිලින් උන්නැහේට මේ පන්සලට ම එන්න කියල මම කියන්නේ නැහැ. මේ පන්සලට එන්න අකමැති නම් වෙන පන්සලකට හරි යන්න. මේ කතාව සිරිමාන්න මහත්තය ඉන්දැද්දි කිව්ව නම් සිරිමාන්න මහත්තයයි අබිලින් උන්නැහෙයි පරම වෛරක්කාරයො දෙන්නෙක් වෙන්න ඉඩ තිබුණා. ඒ වගේ ම සිරිමාන්න මහත්තයට නොයෙක් නින්දා අපහාස විඳින්න සිද්ධ වෙන්නත් ඉඩ තිබුණා. දැන් ඉතින් අබිලින් උන්නැහේ නිකමට වත් සිරිමාන්න මහත්තය ගැන වෛරයක් හිතන්න එපා. අපි ඒ වගේ අයට අනුකම්පා කරන්න ඕනැ. ඔන්න මට මුලින් වෙච්ච පොරොන්දුව වගේ කාට වත් මේ ගැන හුස්මක් වත් හෙළන්න නම් එපා.''

ලොකු හාමුදුරුවන්ගේ වචන අබිලින් උන්නැහේට ඇහුණේ සිහින ලොවක සිට එන හඬක් සේ ය. ඒ වචන නැවත නැවතත් ඔහුගේ සවන් වටා දෝංකාර දෙන්නාක් මෙන් විය. ලොකු හාමුදුරුවන් විසින් පවසන ලද වචනවලට සවන් දීගෙන සිටින කාලය තුළ අබිලින් උන්නැහේගේ සිත තුළ පහළ වූ සංකීර්ණ සිතිවිලි මාලාව අතර කෝපය, ශෝකය, විස්මය ආදි දේ ද මතු වෙවී තිබුණි. අන්තිමට ඔහු හාමුදුරුවන් දෙස බලා මෙසේ ඇසුවේ සෝබර හඬකිනි.

''ඇයි හාමුදුරුවනේ සිරිමාන්න මහත්තය මෙහෙම දෙයක් කළේ?''

''ඒ වෙලාවෙ සිරිමාන්න මහත්තය හිටිය තත්ත්වෙ හැටියට මට එයාගෙන් ඔහොම දෙයක් අහන්න පුළුවන්කමක් තිබුණේ නැහැ. කාටත් හොරා මට එයාගෙන් ඔය ගැන අහන්න ඕනෑකම තිබුණ. ඒත් ඔය සිද්ධියෙන් පස්සෙ සිරිමාන්න මහත්තය මට හරියකට මුහුණ දීලා කතා කරන්න ආවෙ නැහැ. දායක සභාවට ආවත් ධර්ම ශාලාවෙ ඉඳල හොරෙන් ම වාගේ යන්න ගියා. මේ රහස කාටවත් එළි නූණත් සිරිමාන්න මහත්තය ඔය සිද්ධිය හින්ද එදා ඉඳල ම විශාල හිත් වේදනාවක් වින්ද බව නම් මට හොඳට ම පැහැදිලි යි. සිරිමාන්න මහත්තය බලා ඉන්දැද්දි ම වගේ වැහැරෙන්න පටන් ගත්ත. අන්තිමේ දී අංශභාගෙ හැදිල මැරිල ගියා.''

හාමුදුරුවන් විසින් පවසන වචන අසා ගෙන සිටින විට පසු ගිය කාලය තුළ සිරිමාන්න මහත්තයා තුළ දක්නට තිබූ යම් යම් වෙනස්කම් ගැන අබිලින් උන්නැහේට ද සිහිපත් විය. පසුගිය කාලය තුළ දී සිරිමාන්න මහත්තයාගේ තම නිවසට පැමිණීමේ පුරුද්ද බොහෝ දුරට අඩු වූ බවත්, ඔහු තමා සමග කතා කරන විට කිසියම් චකිතයකින් කතා කළ ආකාරයත් අබිලින් උන්නැහේට මතක් වූයේ ය.

සිරිමාන්න මහත්තයා මිය යාමට දින හතරකට පමණ පෙර දවසක් අබිලින් උන්නැහේ ඔහු බැලීමට ගියේ ය. අංශභාගය වැලඳී ඔත්පළ වූ දා සිට ම සිරිමාන්න මහත්තයට කතා කර ගැනීමට බෙහෙවින් අපහසු වූ අතර, මේ වන විට ඔහුගේ තත්ත්වය හොඳට ම දුර්වල වී කොහෙත් ම කතා කර ගත නො හැකි තත්ත්වයට පත් වී සිටියේ ය. අබිලින් උන්නැහේ ඇඳ ළඟට ආ විට සිරිමාන්න මහත්තයා කුමක් දෝ පවසා ගැනීමට උත්සාහ කරමින්

තොල් සෙලවී ය. එහෙත් කෙඳිරි ගෑමක් විනා වෙනත් හඬක් පිට නො වී ය. වැහැරී ගිය මුහුණේ යටට ගිලී ගිය දෙනෙත්වලින් හෝ ගා කඳුළු ගලා ගෙන ආවේ ය. ඒ සමග ම ඔහුගේ මුළු සිරුර ම වෙවුලා ගියේ ය. සිරිමාන්න මහත්තයා අන්තිමේ මිය යාමට පෙර තමාට කියා ගන්නට උත්සාහ ගන්නට ඇත්තේ මේ සිද්ධිය සම්බන්ධයෙන් විය යුතු යයි අබිලින් උන්නැහේට සිතුණි. ලොකු හාමුදුරුවන්ගේ කරුණාබර කට හඬ යළි නැගී එන්නට විය.

"මට නම් ඕකට හේතුව හිතා ගන්න පුළුවන් අබිලින් උන්නැහෙ. කොච්චර හොඳ තත්ත්වෙකින් හිටියත් හැඟීම්වලට වහල් වුණාට පස්සෙ සමහර මනුස්සයො තමන් මොනව කරනව ද කියල ඒ ගොල්ල ම දන්නෙ නැහැ. බොහොම අලංකාරෙට වතුර මල හැදිල හැම දෙනා ම ඒ ගැන කතා කරන්න වුණා ම, එයාට නැති කීර්තියක් අබිලින් උන්නැහේට ලැබෙන්න යනව කියල සිරිමාන්න මහත්තයගේ හිතේ මොකක් දෝ ඊර්ෂ්‍යාවක් ඇති වෙන්න ඇති. ඊර්ෂ්‍යාව කියල කියන්නේ මහ පුදුමාකාර දෙයක්, අබිලින් උන්නැහෙ. අපි කොච්චර සිල්වත්තු වගේ සමාජෙට පෙන්නුම් කරගෙන හිටියත් හදවත ඇතුළෙ තියෙන මලකඩ ලේසියෙන් කඩන්න බැහැ. බියකරු සිතුවිලි හදවත ඇතුළෙ යක්කු වගේ කෑ ගහනවා. වඩාත් උදාර වෙන්නෙ හදවත ඇතුළෙ තියෙන අන්න ඒ මලකඩ කඩල දාල ආධ්‍යාත්මික ගුණ වගාවක් ඇති කර ගැනීම යි. කතා කර කර හිටිය මදෑ. දැන් ඉතින් අපි යමු."

ලොකු හාමුදුරුවෝ වාඩි වී සිටි තැනින් නැගී සිටියහ. ලොකු හාමුදුරුවන්ගේ කරුණාවෙන් පිරි මුහුණ දෙස බලා ගෙන සිටි අබිලින් උන්නැහේගේ සිත තුළ උන් වහන්සේ කෙරෙහි ඇති වූයේ විශාල ගෞරවයකි. හාමුදුරුවන්ට වැඳ අබිලින් උන්නැහේ ද නැගී සිටියේ ය. ලොකු හාමුදුරුවෝ පන්සල දෙසට පා ඔසවන්නට වූහ.

සන්ධ්‍යා සමයේ සිසිලසින් මුළු පන්සල් වත්ත ම සන්සුන්ව ඇත්තා සේ ය. බෝධීන් වහන්සේගේ දිගු ශාඛාවක් ඊට නුදුරින් ඇති චෛත්‍යය දෙසට විහිද ඇත. හමන මඳ පවන නිසා කොළවලින් පිරි එම බෝධි ශාඛාව සෙමින් සෙමින් සැලෙන්නේ නෙත සිත සනසාලමින් සුදෝ සුදු පැහැයෙන් බැබළි බැබළී විරාජමාන වන චෛත්‍ය රාජයාණන් වහන්සේට පවන් සලන්නා සේ ය. ඒ දෙස බලමින් ගමන් කළ අබිලින් උන්නැහේගේ සිත ද මොහොතකට සන්සුන් වූවාක් මෙන් විය.

## අවබෝධය

1. “අපි කොච්චර සිල්වත්තු වගේ සමාජෙට පෙන්නුම් කර ගෙන හිටියත් හදවත ඇතුළෙ තියෙන මලකඩ ලේසියෙන් කඩන්න බැහැ” මේ ප්‍රකාශය වතුර මල කෙටිකතාවෙන් තහවුරු වන ආකාරය නිදසුන් දක්වමින් සනාථ කරන්න.
2. යථාර්ථය පසක් වූ විට මිනිස් සිතෙහි පවතින වෛරය, ක්‍රෝධය වැනි සිතුවිලි ක්‍රමානුකූලව පහව යන ආකාරය අබිලින් උන්නැහේගේ චරිතය ඇසුරින් විමසන්න.
3. ‘වතුර මල’ කෙටිකතාව සාර්ථක වීම සඳහා යොදා ගත් නිර්මාණාත්මක භාෂා ලක්ෂණ කවරේ දැයි නිදසුන් දක්වමින් පෙන්වා දෙන්න.
4. “මිනිසා තම හැඟීම්වලට වහල් වූ විට ක්‍රියා කරන ආකාරය පුදුම සහගත ය” වතුර මල කෙටිකතාව ඇසුරින් මේ බැව් සාකච්ඡා කරන්න.
5. “සංකීර්ණ චරිත නිරූපණය නිසා වතුර මල කෙටිකතාව වඩාත් සාර්ථකත්වයට පත්ව ඇත.” සිරිමාන්න මහතාගේ හා ලොකු හාමුදුරුවන්ගේ චරිත නිදසුන් කොට ගනිමින් මේ අදහස තහවුරු කරන්න.

## ලිඛිත අභ්‍යාස

1. පහත උද්ධෘතවල අවස්ථා සම්බන්ධය ලියන්න.
   i. “මොනව කළත් අපරාදෙ මුදල් නාස්ති කරන්න නරකයි.”
   ii. “ඔව්, ඉතින් ඔය වැඩේ නම් නරකයි කියන්න බැහැ.”
   iii. “ඒ හොයල බැලිල්ලෙන් මට ඇති වැඩක් නැහැ.”
   iv. “හොඳමයි, තමුන්නාන්සෙ කියනව නම් මම පොරොන්දු වෙන්නම්.”

## ප්‍රායෝගික අභ්‍යාස

1. කෙටිකතාවක් නිර්මාණය කිරීමේ දී අවධානය යොමු කළ යුතු මූලික කරුණු කවරේ දැයි සොයා පෙළ ගස්වන්න.
2. සුදුසු තේමාවක් තෝරා ගෙන කෙටිකතා අංග ලක්ෂණ කෙරෙහි අවධානය යොමු කරමින් රසවත් කෙටිකතාවක් නිර්මාණය කරන්න.
3. එසේ නිර්මාණය කළ කෙටිකතා එකතු කොට කෙටිකතා සංග්‍රහයක් සකස් කර පන්තියේ සියලු ළමයින්ට කියවීමට සලස්වන්න.
4. ‘වතුර මල’ කෙටිකතාවේ ඇති කෙටිකතා ලක්ෂණ පිළිබඳව පන්තියේ දී ගුරුතුමා/ගුරුතුමිය සමග සාකච්ඡා කරන්න.